www.kidworship.kr

# ජෝෂුවා

– 24th Story–



174Page

**පොතේ ගුරා** දාවිත් රජතුමා වගේම ඉශ්රායෙල් හී රජ වූ සොලමොන් දෙවියන්වහන්සේට බොහෝ සේ ප්‍රේම කළ කෙනෙක් ය.
බොහෝ කාලයක් ගෙවී ගොස් තිබුණත් මේ වන විටත් දෙවියන්වහන්සේට දේව මාලිගාවක් ඉශ්රායෙල්හී ගොඩ නගා තිබුණේ නෑ.
ඒ නිසා ජනතාව උස් තැන්හී දෙවියන්වහන්සේට නමස්කාර කළා.
දවසක්  සොලමොන් රජතුමා දෙවියන්වහන්සේ නමස්කාර කරන පිණිස ගිබියොන් වලට ගියා. එය ඉතාම උස් ස්ථානයක්ව තිබුණා.
එහි අල්තාරය ළග සොලමොන් රජු විසින් පූජාවන් දහසක් කර තිබුණා.
දෙවියන්වහන්සේ ද සොලමොන්'රජුගේ පූජාවන්ට ඉතා ප්‍රසන්නව සිටියා.
දවසක්දා හීනයක් තුළින් දෙවියන්වහන්සේ සොලමොන් ඉදිරියේ පෙනී සිටියා.


**දෙවියන්වහන්සේ** සොලමොන් ඔබට අවශ්‍ය මොනවාදැයි මට කියන්න.
මම ඔබ ඉල්ලන  ඕන දෙයක් දෙන්නම්.

**සොලමොන්** මාගේ ජනතාව විනිශ්වය කරන පිණිස මට ප්‍රඥාව සහ දැනගැන්ම දෙන්න ස්වාමිනී.

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ සාලමොන්'ගේ ඉල්ලීමට ඉතා ප්‍රසන්න වුණා.

**දෙවියන්වහන්සේ** නුඹ දීර්ඝායු ඉල්ලන්නේවත්, ධනය ඉල්ලන්නේවත් නැතිව විනිශ්වය තේරුම් ගැනීමට නුවණ ඉල්ලූ බැවින් මම නුඹේ වචනය ලෙස නුඹට දෙන්නෙමි. නුඹට සමාන කෙනෙක් නුඹට පළමුවෙන් සිටියේවත් නුඹට පසුව සිටින්නේත් නැති ලෙස ප්‍රඥාවන්ත් නුවණැති සිතක් නුඹට දෙන්නෙමි.

..........................................................................................



175Page

**පොතෙ ගුරා** සොලමොන් රජු ජනතාවගේ බොහෝ ප්‍රශ්ණ ආරවුල් සමථයකට පත් කරනු ලැබුවා. එක් දවසක් කාන්තාවන් දෙදෙනෙක් එක් ළදරුවෙක් රැගෙන සොලමොන් රජු වෙතට ආවා.

**1 කාන්තාව** අපි එකම ගෙදරක ජීවත්වෙන්නේ.
එක්තරා රාත්‍රියකදී හදිසියේම මේ කාන්තාවගේ දරුවා මිය ගියා.

**පොතෙ ගුරා** එවිට මේ කාන්තාවන් නැවතත් කතා කරන්නට වුණා.

**1 කාන්තාව** මේ මේ කාන්තාව නිදාගෙන ඉද්දී, මම ඇහැරිලා බලද්දී ළදරුවා මැරිලා. එයාගේ මැරුණු ළමයා මා ළග තබා, පණ පිටින් සිටි ළමයාව අරන් දැන් මට දෙන්නේ නෑ. අනේ කොහොමහරි  මගේ ළමයා අරන් දෙන්න...

**පොතෙ ගුරා** මේ අවස්ථාවේදී ඇහුම්කන් දී සිටි දෙවන කාන්තාවත් කථා කරන්නට පටන් ගත්තා.

**2 කාන්තාව** නෑ නෑ.. මේ ඇතතක් නොවේ. මේ කාන්තාව කියන හැමදෙයක්ම බොරු.
මේ කාන්තාව නින්දෙන් ළමයාගේ ඇග උඩ වැටී ළමයා මැරුණා.
එයා දැන් මාගේ ළමයාව ගන්න හදනවා. මොකද මේ අය දැනටමත් ජීවත්වෙන ළමයාට අකමැති නිසා එම දරුවාට ඔවුන් විහිළු කරනවා.

**පොතේ ගුරා** කාන්තාවන් දෙදෙනාම එකම දරුවෙක් වෙනුවෙන් තර්ක කරන්නට වුණා.



176Page

| | |
|---|---|
| පොතේ ගුරා | සලමොන් දේව ප්‍රඥාවෙන් මඳ වෙලාවක් කල්පනා කරමින් විශ්මයජනක තීන්දුවකට පැමිණියා. |
| සොලමොන් රජු | කවුරුහරි එක්කෙනෙක් මට පිහියක් ගේන්න. |
| දාසයෙක් | එසේය ස්වාමිනි... |
| පොතේ ගුරා | සොලමොන් ඉල්ලූ ගමන්ම ඔහුට පිහියක් ලැබුණා. ඒ වගේම කළ යුතු දේ කුමක්දැයි දාසයාට කියා දුන්නා. |
| සොලමොන් රජු | පිහිය ගෙන දරුවා ව භාගයක් බැගින් කපන්න. එක් භාගයක් එක් තැනැත්තියකටත්, අනෙක් භාගය අනිත් තැනැත්තියටත් දෙන්න. |
| පොතේ ගුරා | සියල්ලෝම විශ්මයට පත්වුණා. එක් කාන්තාවක හඬා වැළපෙන්නට වුණා. |
| 1 කාන්තාව | කරුණාකරලා මගේ දරුවාව කපන්න එපා. දරුවව ඒ කාන්තාවටම දෙන්න. |
| පොතේ ගුරා | නමුත් අනිත් කාන්තාව දැස් කරකවා බලා මෙසේ කීවා. |
| 2 කාන්තාව | යන්න .... ගිහින් දරුවාව භාගය බැගින් කපන්න. |
| | හ්ම්... එතකොට අපි දෙන්නටම නැති වෙයිනේ. |


.......................................................................................................



177Page

| | |
|---|---|
| පොතෙ ගුරා | ස්වල්ප වේලාවකට පසුව, සොලමොන් රජතුමා තීරණයකට ආවා. |
| සොලමොන් රජු | මේ ළමයා ජීවත්වෙන්න ඕන කියපු අම්මට මේ දරුවා දෙන්න. මන්ද සැබෑම අම්මා වන්නේ ඇයයි. |
| පොතෙ ගුරා | දරුවා දෑතින් රැගෙන ගොස් සැබෑ මවට බාර දුන්නා. සොලමොන් රජතුමාගේ මේ පුදුම ප්‍රඥාව ගැන සියලුදෙනාම විශ්මයට පත් වුණා. සොලමොන් රජු දේව ප්‍රඥාවෙන් මේ වගේම ජනතාවගේ විනිශ්චයන් නිවැරදිව ලබා දුන්නා. |
| පොතෙ ගුරා | සොලමොන් රජුගේ මේ ඥානවන්ත පාලන ක්‍රමය නිසා ඉශ්රායෙල් දේශය පුරාම සමාදානය පිරී තිබුණා. මේ රජතුමාව, මේ ප්‍රඥාවන්ත රජතුමා පිළිබඳ ආරංචිය අනෙක් දේශවලටත් පැතිර ගියා. බොහෝ දෙනෙක් සොලමොන්ගේ ප්‍රඥාව ගැන අසා ඔහුව මුණගැසෙන පිණිස ආවා. ෂෙබා හී රැජිණත් සොලමොන්ගේ ප්‍රඥාව ආරංචි වී රත්‍රං, සිල්වර් බඩු රැගෙන ඔහුව මුණ ගැසෙන්නට ආවා. බොහෝ මිනිසුන් ද සොලමොන් වෙතට ආවා. ෂෙබා හී රැජින සොල-මොන් ගේ ප්‍රඥාව නිරීක්ෂණය කළා. |
| ෂෙබා හී රැජින | මේ ලෝකයේ තිබෙන වැදගත්ම කාරණාව කුමක් කියා නුඹලා සිතනවා ද ? |
| සොලමොන් | මේ ලෝකයේ තිබෙන වැදගත්ම දේ නම් ප්‍රඥාවයි. |
| පොතේ ගුරා | ෂෙබා හී රැජින දිගින් දිගටම ප්‍රශ්ණ කළා. සොලමොන් රජු ඒවායින් එකක්වත් නෑර ඒවාට පිළිතුරු ලබා දුන්නා. කිසිම ප්‍රශ්ණයක් ඔහුට අසීරු වුණේ නෑ. දෙවියන්වහන්සේ සොලමොන්ට දී තිබු ප්‍රඥාව ගැන රැජිණත් විශ්මයට පත් වුණා. ඒ සම්බන්ධයෙන් ඇය දෙවියන්වහන්සේට ප්‍රශංසා කළා. ඇය විසින් ගෙනා වටිනා තෑගි ඔක්කොම ඇය ලබා දුන්නා. |

.......................................................................................................



178Page

| | |
|---|---|
| පොතේ ගුරා | සොලමොන් රජු මේ වතාවේදී ලෙබොනොන් වලින් ගෙනා වටිනා දේවල්ද රැගෙන රජතුමා දේව මාළිගාව ගොඩනගන්නට අදහස් කළා. ගල් සහ වටිනා දේවල් රැගෙන මිනිසුන් අවුරුදු 7ක් දේව මාලිගාව සෑදුවා. පසුව ජනතාව එහි ගොස් දෙවියන්වහන්සේට නමස්කාර කළා. |

| | |
|---|---|
| **සොලමොන්** | **ඔහ් දෙවි සමිඳුනි. ඔබගේ ඉමහත් කරුණාව අපට ලැබුණු නිසා ප්‍රශංසා වේවා.** |
| **පොතේ ගුරා** | **සොලමොන් රජතුමා මෙවැනි යාච්ඥාවක්ද ඔප්පු කරනු ලැබුවා.** |
| **සොලමොන්** | **ඉශ්‍රායෙල් දෙවි රජිදාණෙනි ‼ ස්වර්ගයේවත් පොළොවේවත් ඔබ හා සමාන වෙන දෙවිකෙනෙක් නැත. දැනුදු මේ ස්ථානයේ දී ඔබගේ දාසයා වන මම කරන යාච්ඤාවට සවන් දුන මැනවි.**<br>**ඔබවහන්සේගේ දෑස් නිරන්තරයෙන්ම මෙහි වන්නේ ය.**<br>**දවල් සහ රාත්‍රියේ ඔබගේ ඇස් මෙහිම වේවා.**<br>**යමෙක් වරදක් කළේ නම්, ඔහු හෝ ඇය මේ ස්ථානයේදී පසුතැවී යාච්ඤා කරන්නේ නම්, දෙවියන්වහන්සේ ඔවුන්ගේ යාච්ඤාව අසා, ඔබගේ දාසයන්ගේ වරද කමා කළ මැනවි.** |
| **පොතේ ගුරා** | **සොලමොන් රජු ස්වර්ගය දෙසට දෑත් ඔසවා ඉශ්‍රායෙල් ජනතාවට ආශීර්වාද කොට යාච්ඤා කළා.** |
| | **.......................................................................................** |
| **ජිවිතයට අදාල කිරීම** | **ආදර දුවේ පුතේ ...**<br>**දෙවි පියාණන්වහන්සේ ඔබෙන් ඇසුවොත් " ඔයාට මොනවද ඕන "**<br>**මී.. මී... ඔබත් දෙවියන්වහන්සේගෙන් ප්‍රඥාව, ඉල්ලන්න.**<br>**උන්වහන්සේ එය ඔබට දෙනවා ඇත.** |